# යුද්ධය අවසන් වීමට පෙර හා අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා

එච්.ඩී.පී. මධුෂානි[1] ඩබ්.වී.පී.එම් නයෝමි[2]
ඩී.එම්.එච්. දසනායක[3] එල්.ජී.ඩී පෙරේරා[4]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය ඉතා ඈත අතීතයකට හිමිකම් කියන හා දිනෙන් දින වර්ධනය වෙමින් ඉදිරියට පැමිණෙන කර්මාන්තයකි. මෙම සංචාරක ව්‍යාපාරයෙන් අප රටට ගලා ආ විදේශ විනිමය ප්‍රමාණය අතිමහත්ය. නමුත් 1983 ආරම්භ වූ සිවිල් යුද්ධය හේතුවෙන් සංචාරක කර්මාන්තයේ වර්ධනය යම්කිසි කඩා වැටීමකට ලක්විය. එය රටේ ආර්ථිකයට දැඩි බලපෑමක් ඇති කරන ලදී. නමුත් 2009 වර්ෂයේදී යුද්ධය අවසන් වීමෙන් පසු නව දිශාවකට, නව ප්‍රවණතා වලට යොමු වී ඇතිද යන්න ගැටලු සහිතය. ඒ අනුව සිවිල් යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ නව ප්‍රවනතා පිළිබඳව හැදෑරීමක් කිරීම හා එමගින් අත්පත් කරගත හැකි වාසිදායක තත්වයන් මොනවාද යන්න සොයාබැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා ද්විතීයික දත්ත භාවිතා කරන ලද අතර ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික සංඛ්‍යාන වාර්තා මගින් දත්ත ලබා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ නව ප්‍රවනතා හා ඉන් ලබාගත හැකි වාසිදායක තත්වයන් පිළිබඳව විශ්ලේෂණය සදහා පරාමිතික හා අපරාමිතික පරීක්ෂාවන් භාවිත කර ඇත. මෙම අධ්‍යයනය තුලින් යුද්ධය අවසන් වීමට පෙර සහ යුද්ධය අවසන් වීමෙන් පසු දකුණු ආසියානු හා බටහිර යුරෝපානු මහද්වීප දෙකින් පැමිණි සංචාරකයින්ගේ වැඩි වීමක් සිදු වී ඇති බවත් ඒ ඒ මාස අනුව සංචාරකයින් මෙරටට පැමිණීමට ඇති කැමැත්තෙහි වර්ධනයක් පවතින බවත් අනාවරණය විය අනුව යුද්ධයට පෙර විවිධ වයස් කාණ්ඩවලින් මෙරටට පැමිණි සංචාරකයින්ගේ කැමැත්තෙහි වෙනසක් ඇති බවත් යුද්ධමය තත්වය මත සංචාරකයන්ගේ පැමිණීම විචලනය වී ඇති බවත් අනාවරණය විය. මීට අමතරව යුද්ධයට පෙර හා පසු වර්ෂවලදී සංචාකයන්ගේ පැමිණීමේ අරමුණු වෙනස් වී ඇති බවත් දත්ත විශ්ලේෂණය මගින් තහවුරු විය. සංචාරක කර්මාන්තයේ මෙම ප්‍රවනතා ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයට මෙන්ම ආර්ථික, සමාජීය හා සංස්කෘතික තත්වයන්ට බලපෑම්

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
pavithrahdm@gmail.com

[2] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
wickramasinghe.mahesha@yahoo.com

[3] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
harshanidasanayake1991@gmail.com

[4] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය
gdinusha.perera@gmail.com

ඇති කරලීමට සමත් වී තිබේ. එබැවින් රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධව කටයුතු කිරීමෙන් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙ නව ප්‍රවනතා ආර්ථික සංවර්ධනයට දායක කර ගත හැකිය.

**මුඛ්‍ය පද :** *සිවිල් යුද්ධය, සංචාරක ව්‍යාපාරය, නව ප්‍රවනතා , සිවිල් යුද්ධය*